# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2229/9 - 2021 මැයි මස 28 වැනි සිකුරාදා - 2021.05.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**1949 අංක 58 දරන මුදල් නීති පනත**

1949 අංක 58 දරන මුදල් නීති පනතෙහි 68 වන වගන්තිය සමග එක්ව කියවිය යුතු 10 (c) වන වගන්තිය යටතෙහි සාදනු ලබන රීති

මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2021 මැයි මස 28 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

**අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම**

1. මෙම රීති "2021 අංක 4 දරන අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. 2021 මාර්තු 9 වැනි දිනැති අංක 2218/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කළ අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති සහ 2021 අප්‍රේල් 9 වන දිනැති අංක 2222/60 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කළ අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති මගින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කළ සහ 2021 පෙබරවාරි මස 18 වැනි දිනැති අංක 2215/39 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කළ 2021 අංක 1 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති, තවදුරටත් මෙමගින් සංශෝධනය කරනු ලැබේ.

**අ. එහි 4 වන රීතිය ඉවත් කිරීමෙන් සහ පහත සඳහන් රීති ඒ වෙනුවට ආදේශ කිරීම මගින්**

"4. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, ඉහත 3 වන රීතිය යටතේ ඉල්ලා ඇති පරිදි අපනයනය මගින් ලද මුදල් ලැබී දින තිහක් (30) ඇතුළත, බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ශ්‍රී ලංකාවට ලද මුළු මුදලින් සියයට විසි පහක (25%) ප්‍රතිශතයකට නොඅඩු ප්‍රමාණයක් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කළ යුතුය.

4 අ. කෙසේ වෙතත්, විශේෂිත අපනයන අංශයන්හි හෝ අපනයන කර්මාන්තයන්හි හෝ තනි අපනයනකරුවන්ගේ අපනයන භාණ්ඩ සහ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ දේශීය වශයෙන් සපයාගත නොහැකි ආනයනික භාණ්ඩ ඉතා ඉහළ ප්‍රතිශතයක් භාවිත කරන බවට මුදල් මණ්ඩලය සෑහීමකට පත්වේ නම්, එවන් විශේෂිත අපනයන අංශයකට හෝ අපනයන කර්මාන්තයකට හෝ තනි අපනයනකරුවන්ට, ඔවුන්ගේ ශ්‍රී ලංකාවට ලැබෙන මුළු අපනයන ආදායමෙන් සියයට විසිපහක (25%) ප්‍රතිශතයකට වඩා අඩු ප්‍රමාණයක් රුපියල් බවට පරිවර්තනය කිරීමට අවසර දීමට මුදල් මණ්ඩලයට එහි අභිමතය පරිදි තීරණය කළ හැකිය.

කෙසේ වෙතත්, කිසිදු අවස්ථාවක, ඉහත සඳහන් කළ පරිදි, මුදල් මණ්ඩලය සිය අභිමතය පරිදි ලබා දිය හැකි එවැනි ආංශික නිදහස් කිරීමක් මුළු අපනයන ආදායමෙන් සියයට දහයකට (10%) අඩු නොවිය යුතුය."

"4 ආ. ඉහත රීති 4 සහ 4අ හි සඳහන් එම පරිවර්තන දිනය, ඉහත 3 (i) රීතියට අනුව ශ්‍රී ලංකාවට අපනයන ආදායම් ලැබීමට නියමිත දිනයට පසු දිනයක් නොවිය යුතුය. (එනම්, නැව් ගත කළ දින සිට දින එකසිය අසූවකට (180) නොවැඩි විය යුතුය.)"

**ආ. 5 වන රීතිය ඉවත් කිරීමෙන් සහ පහත සඳහන් රීතිය ඒ වෙනුවට ආදේශ කිරීම මගින්**

"5. මුදල් මණ්ඩලයට විදේශ විනිමය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වය සහ ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත මට්ටම් සළකා බලා ශ්‍රී ලංකාවට බලපත්‍රලාභී බැංකු හරහා ලැබෙන අපනයන ආදායම්වලින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කළ යුතු යැයි පවත්නා තත්ත්වයන් යටතේ යෝග්‍ය හා ගැලපෙනු ඇතැයි සිතිය හැකි, එවැනි වෙනත් ප්‍රතිශතයක් අවශ්‍ය පරිදි කළින් කලට පොදුවේ තීරණය කළ හැකිය."

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.